# ප්‍රසම්පාදන දැන්වීමයි

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

## බේරුවල ධීවර වරායේ මාළු වෙන්දේසි ශාලාව කෙරවල පිහිටි වර්ග අඩි 104 කින් යුත් කාමරය මාසික කුලී පදනම මත බදුදීම සඳහා ලංසු කැඳවීම

### ප්‍රසම්පාදන අංක CFHC/SD/T/RENT-ROOM/BRW / 2024-08

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට අයත් බේරුවල ධීවර වරායේ මාළු වෙන්දේසි ශාලාව කෙලවල පිහිටි වර්ග අඩි 104 කින් යුත් කාමරයක් වසර 03 ක කාලයක් සඳහා බදුදීම වෙනුවෙන් ලංසු කැඳවනු ලැබේ. ලංසු ඉදිරිපත් කිරීම සඳහා වන අයදුම් පත්‍ර ප්‍රධාන කාර්යාලයෙන් හෝ බේරුවල ධීවර වරායේ මුදල් භාරකරු වෙත රු.1000/= ක (ආපසු නොගෙවනු ලබන) සහ රු.5000.00 ක් (ආපසු ගෙවනු ලබන) ගෙවීමකින් අනතුරුව ලබාගත හැක.

ලංසු පත්‍රිකා නිකුත් කිරීම 2024.02.02 දින සිට 2024.02.15 වන දින දක්වා කාර්යාලීය වේලාවන් තුල (පෙ.ව 9.00 සිට ප.ව 3.00) බේරුවල ධීවර වරායේ සහ ප්‍රධාන කාර්යාලයේදී සිදු කරනු ලැබේ.

සම්පූර්ණ කරන ලද ලංසු පත්‍රය ලිපිකවරය බහා මුද්‍රා තබා ලිපිකවරයේ වම්පස උඩ කෙළවරේ "බේරුවල ධීවර වරායේ මාළු වෙන්දේසි ශාලාව කෙරවල පිහිටි වර්ග අඩි 104 කින් යුත් කාරමරයක් බදුදීම" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවන්නේ නම් සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, රොක් හවුස් පටුමග, කොළඹ-15 යන ලිපිනයට හෝ ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට 2023.02.16 දින ප.ව 2.00 ට පෙර බහාලිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගෙන අවසන්වූ වහාම ලංසු විවෘත කරන අතර, ලංසුකරුට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයකුට එම අවස්ථාවට සහභාගි විය හැක.

වැඩි විස්තර සැපයුම් කළමණාකාර (කොළඹ- ප්‍රධාන කාර්යාලය) / වරාය කළමණාකාර (බේරුවල) වෙතින් ලබාගත හැක. දුරකතන අංක ඃ 011-2525063/034-2277460.

සභාපති,
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංකඃ15, රොක්හවුස් පටුමග,කොළඹ-15,